www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සසප අවසාන මැතිවරන රැස්වීම ජනවාරි 23 කොලඹ දී පැවැත්වෙයි

## Final SEP election meeting in Colombo on January 23

2010 ජනවාරි 21

සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) පක්ෂයේ මැතිවරන උද්ඝෝෂනය නිමා කිරීමේ අවසාන ප්‍රසිද්ධ රැස්වීම ජනවාරි 23 දා කොලඹ දී පැවැත්වීමට නියමිත ය.

කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සහ ජීවන තත්වයන් ආරක්ෂා කිරීම සඳහා සමාජවාදී ඉදිරි දර්ශනයක් ඉදරිපත් කරන එකම ජනාධිපති අපේක්ෂකයා විජේ ඩයස් ය. දකුනු ආසියාවේ සහ ජාත්‍යන්තරව සමාජවාදය සඳහා අරගලයේ කොටසක් ලෙස ශ්‍රී ලංකාව තුල කම්කරු ගොවි ආන්ඩුවක් බලයට ගෙන ඒමට සසප සටන් කරයි.

දෙමල විමුක්ති කොටි සංවිධානයේ (එල්ටීටීඊ) පරාජයත් සමග කෙලවර වූ යුද්ධයේ විනාශකාරී ප්‍රතිවිපාක වලට ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ ප්‍රතිවාදියා වන ජෙනරාල් සරත් ෆොන්සේකා වග කිව යුතු ය. සාමයේ සහ සමෘද්ධියේ නව යුගයක් පිලිබඳ රාජපක්ෂගේ පොරොන්දු බොරුවක් බව ඔප්පු වී ඇත. මැතිවරනය අවසන් වූ වහාම නව ආන්ඩුව කම්කරු පන්තියේ සමාජ තත්වයන් මත නව රුදුරු ප්‍රහාරයක් එල්ල කරනු ඇත.

ඉදිරියේ එලඹෙන පන්ති සටන සඳහා කම්කරු පන්තිය සූදානම් කිරීමේ ව්‍යායාමයක සසප යෙදී සිටී. රැස්වීමට සහභාගි වෙමින් සසපයේ සමාජවාදී ඉදිරිදර්ශනය සහ ක්‍රියාමාර්ගය පිලිබඳව වැදගත් සාකච්ඡාවකට එලඹෙන ලෙස අපි කම්කරුවන්ට තරුනයන්ට ගෘහනියන්ට සහ බුද්ධිමතුන්ට ආරාධනය කරමු.

| | |
|---|---|
| ප්‍රධාන කථිකයා : | සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස් |
| ස්ථානය: | මහජන පුස්තකාලය කොලඹ. |
| දිනය සහ වේලාව: | ජනවාරි 23 සවස 3.00ට. |